විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 9/96

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත.
කොළඹ - 10.
1996.12.06 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම ගැන්වීම

රජයේ සේවකයන් විශ්‍රාම ගැනීමේ වෛකල්පිත වයසට එළඹීමට පෙර විශ්‍රාම ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 මගින් සලසා තිබූ ඉඩ ප්‍රස්ථාවන්, 1996.11.12 දිනැති අංක 32/96 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් අවලංගු කර ඇත.

02. මේ අනුව 1996.12.17 දින හෝ ඉන්පසුව ක්‍රියාත්මක වන සියලුම විශ්‍රාම ගැනීම් සඳහා පහත සඳහන් පදනම මත විශ්‍රාම වැටුප් ගණන් බැලීම් හා ඒ අනුව ගෙවීම් කළයුතුය.

අ. මාස එකසිය විස්සක දළ සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් හිමිකම් ලබාගන්නා නිලධාරියකු වයස සම්පූර්ණ වීමේ පදනම මත හෝ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලබන කුමන හෝ විශ්‍රාම ගැන්වීමක් මත හෝ විශ්‍රාම යනු ලබන්නේ නම් අමුණා ඇති චක්‍රයේ විධිවිධාන අනුව ඔහුගේ සේවා කාලයට හා වැටුපට අදාළ 'අඩු නොකළ' විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හිමිකම් ඇත්තේය.

ආ. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ස්වකීය මනාපය පළ කිරීමෙන් පසුව මාස 24 ක විශ්‍රාම වැටුපට සමාන පරිවර්තිත පාරිතෝෂිකයක් ලබා ගත හැකිය. එම පාරිතෝෂිකය ලබා ගන්නේ නම් එවැනි විශ්‍රාමිකයෙකුට විශ්‍රාම ලැබූ ප්‍රථම වසර 10 තුළ හිමිවන්නේ 'අඩුකල' විශ්‍රාම වැටුපකි. එම 'අඩුකල' විශ්‍රාම වැටුප ඒ ඒ වැටුප් තල අනුව ගණන් බලන ආකාරය අමුණා ඇති චක්‍රයේ සඳහන් කර ඇත. එම වසර 10 අවසානයේ සිට ඉහත 'අ' වගන්තිය යටතේ සඳහන් කරනු ලැබූ 'අඩු නොකළ' විශ්‍රාම වැටුපක් නිලධාරියාට ගෙවනු ලැබේ.

03. යථෝක්ත චක්‍රයෙහි දැක්වෙන්නේ අවුරුදු 25-30 අතර සේවා කාලයක් සහිතව විශ්‍රාම ගන්නා නිලධාරීන්ට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ප්‍රතිශතයන්ය. අවුරුදු 25 ට අඩු සේවයක් සහිතව විශ්‍රාම ලබන යම් නිලධාරියෙකුගේ අවුරුදු 25 ට අඩු එක් එක් මාස 06 ක් හෝ ඉන් කොටසක කාල සීමාවක් සඳහා විශ්‍රාම වැටුප් ගණන් බලන ප්‍රතිශතය 1 ක් බැගින් අඩු කරනු ලැබේ.

/..2

04. නිලධාරියකු විසින් අවුරුද්දකට වඩා වැටුප් රහිත නිවාඩු ලබා ඇති අවස්ථාවක, එසේ වැටුප් රහිත නිවාඩු ලැබූ අවුරුද්දක කාලයක් ඉක්මවන එක් එක් මාසයක් හෝ ඉන් කොටසක කාලසීමාවක් සඳහා ඔහුට අදාල විශ්‍රාම වැටුප් ප්‍රතිශතයෙන් 0.2 ක අඩු කිරීමක් කරනු ලැබේ. එසේ වුවත් පහත සඳහන් අවස්ථාවලදී ලබා ඇති වැටුප් රහිත නිවාඩු කාල සීමාවන් සඳහා ඉහත සඳහන් අඩුකිරීම් කරනු නොලැබේ.

අ. පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝග යෝජනා ක්‍රමයේ සිට 1970 අප්‍රේල් මස 01 දිනයේදී සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරු කිරීමට පෙරාතුව ඔවුනට දී ඇති අර්ධ වැටුප් සහිත සහ වැටුප් රහිත නිවාඩු.

ආ. රජයේ නිලධරයකුගේ වැඩ කටයුතුවලට අදාළව ඔහුට ප්‍රයෝජනවත් විය හැකි උසස් සුදුසුකම් ලබා ගැනීමේ කාර්යය සඳහා ඔහුට ප්‍රදානය කරන ලද වැටුප් රහිත නිවාඩු.

05. විශ්‍රාම වැටුපක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති නිලධාරියකු දෙපාර්තමේන්තුව හෝ තනතුර අහෝසි කිරීම නිසා විශ්‍රාම ගන්වනු ලබන්නේ නම් විශ්‍රාම වැටුප් සංග්‍රහයට අනුකූලව එම නිලධාරියාගේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවා කාලයට අවුරුදු 05 ක් එකතු කර අවුරුදු ඇති වයසේ අදාළ ප්‍රතිශතය මත විශ්‍රාම ගිය දින සිට විශ්‍රාම වැටුප් ලබා ගත හැකිය.

06. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වෙනත් විශේෂ හේතූන් මත විශ්‍රාම යන නිලධාරීන්ට එකී ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ඒ අයුරින්ම බල පැවැත්වෙන අතර, මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හිමිකම් ඇත.

07. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය කර, එකී තනතුරේ ස්ථිර කරන ලද වසර 05 ක් හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු විශ්‍රාම යෑමට පෙර මියගිය හොත්, එම නිලධාරියා මියගිය දිනයේදී ලැබූ වැටුප හා මියයන විට සම්පූර්ණ කර තිබූ සේවා කාලය පදනම් කර ගෙන මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව මාස 24 ක 'අඩු නොකළ' විශ්‍රාම වැටුපට සමාන පාරිතෝෂිකයක් මරණ පාරිතෝෂිකය ලෙස යැපෙන්නන්ට ගෙවනු ලැබේ.

08. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 හි විධිවිධාන මත විශ්‍රාම යන නිලධාරීන්ට විශ්‍රාම වැටුප හා පරිවර්තිත විශ්‍රාම පාරිතෝෂිකය මුදා හරිනු ලබන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව වන අතර, එම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප ගණනය කරනු ලබන්නේ ඉහත 2 ඡේදයේ සඳහන් පදනම මත වේ.

09. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය මේ අනුව සංශෝධනය කෙරෙනු ඇත.

10. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ .

(වී. ආරිය සමරවීර)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

රූ/-